# PUBLIC ECONOMY
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය

වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය පහත පරිදි දැක්විය හැකි වේ.

- සම්පත් කාර්යක්ෂම ව බෙදා හැරීම
- ආදායම් හා ධනය සාධාරණ ව බෙදා හැරීම
- සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම
- තිරසර සංවර්ධනය ඇති කිරීම
- නෛතික රාමුව හා සමාජයීය පරිසරය සකස් කිරීම

ClassWork.LK

# සම්පත් කාර්යක්ෂම ව බෙදා හැරීම

වෙළෙඳපොල ආර්ථිකයක දක්නට ලැබෙන සම්පත් බෙදී යාමේ ආකාර්යක්ෂමතාවන් ඉවත් කිරීම සඳහා රජය පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රීයාත්මක කරයි.

පොදු භාණ්ඩවලින් මිලක් අය කර ගත නොහැකි නිසාත් ලාභයක් ලැබිය නොහැකි නිසාත් වෙළෙඳපොළ ක්‍රමයෙන් පොදු භාණ්ඩ නොසපයයි. එහෙත් රජය මැදිහත් වී පොදු භාණ්ඩ සපයයි.

වෙළෙඳපොළ ක්‍රමයේ දී අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව නොසැපයීම නිසා රජය විසින් අර්ධ පොදු භාණ්ඩ සපයයි.

ClassWork.LK

ශුභසාධන භාණ්ඩ ප්‍රශස්ත ව සැපයීම සිදු නොවන නිසා ඌන පරිභෝජනයක් සිදු වේ. මේ නිසා ශුභසාධන භාණ්ඩ පරිභෝජනයට පෙලඹවීමට රජය මැදිහත් වේ.

වෙළෙඳපොළ ක්‍රමයක් සමාජයට අහිතකර භාණ්ඩ අවගුණ භාණ්ඩ සමාජයට ප්‍රශස්ත මට්ටමට වඩා වැඩියෙන් නිපදවයි. ඒවා සීමා කිරීමට රජයට සිදු වේ.

**නිදසුන් :** මත්ද්‍රව්‍ය

ClassWork.LK

# ආදායම් හා ධනය සාධාරණ ව බෙදා හැරීම

සාධාරණය ස්ථාපිත කිරීම සඳහා රජයක් මගින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලබයි.

- ආදායම් හා ධන ප්‍රතිව්‍යාප්තිය ඇති කිරීම
- ධන සමුච්චනය පිළිබඳ සීමා පැනවීම
- ඉඩම් ප්‍රතිසංස්කරණය

ClassWork.LK

# සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම

සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමට උද්ධමනය හා සේවා වියුක්තිය ඉවත් කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගනු ලබයි.

# තිරසර සංවර්ධනය ඇති කිරීම

ආර්ථික, සමාජීය හා පාරිසරික යන අංශවල තුලනාත්මක ව වැඩි දියුණු කිරීම, එනම් තිරසර සංවර්ධනය සඳහා වූ වෙළෙඳපොළ ක්‍රමයක් කටයුතු නොකරන අතර රජය ඒ සඳහා මැදිහත් වේ.

ClassWork.LK

# නෛතික රාමුව හා සමාජයීය පරිසරය සකස් කිරීම

නීති පද්ධතිය, උසාවි, නියාමන ආයතන ආදිය, ළමා රැකවරණය, වැඩිහිටි රැකවරණය වැනි කටයුතු සඳහා වෙළෙඳපොළ ක්‍රමයක අවධානය යොමු නොවන හෙයින් රජයට ඒ සඳහා මැදිහත් වීමට සිදු වේ.

ClassWork.LK

# ආණ්ඩුවේ අසමත් වීම්

වෙළෙඳපොළ අසාර්ථක වීම් මැඩ පවත්වා ගැනීම සඳහා රජය මැදිහත් වී විශාල කාර්යභාරයක් ඉටු කළ ද ආණ්ඩුවේ අසමත් වීම සිදු විය හැකි ය.

ආණ්ඩුවේ අසමත් වීම් යනු වෙළෙඳපොළ අසාර්ථක වීම් මැඩ පවත්වා ගැනීම සඳහා රජය විසින් ආර්ථිකය සඳහා කරනු ලබන මැදිහත්වීම් රාජ්‍ය අංශයට ආවේණික වූ ඇතැම් දුර්වලතා කරණ කොට ගෙන අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ආර්ථිකයේ තව තවත් අකාර්යක්ෂමතා බිහි කිරීම යි.

ClassWork.LK

# ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයේ දක්නට ලැබෙන දෘඪතාවන්

## ආණ්ඩුවේ ප්‍රතිපත්ති අතිශයින් මන්දගාමී වීම

ආණ්ඩුවේ මැදිහත්වීම්වල දක්නට ලැබෙන එක් අහිතකර පැතිකඩක් වන්නේ නිරන්තර වෙනස් වන පරිසරයට අනුකූල වන ලෙස අදාළ වෙනස්කම් ඇති කර ගැනීමෙහිලා ආණ්ඩුවේ ප්‍රතිපත්ති අතිශයින් මන්දගාමී වීම ය.

## දේශපාලන ස්වාර්ථය

දේශපාලකයන් සහ රාජ්‍ය නිලධාරින් ස්වාර්ථය අරමුණු කොට ක්‍රියා කිරීමෙන් සම්පත් නාස්තියක් සිදු වීම

**නිදසුන් :**
මහා මාර්ග, රෝහල්, පාසල් ඉදි කිරීමේ දි දේශපාලන අවශ්‍යතා පදනම් කර ගැනීම

ClassWork.LK

## ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල අවිදුර දෘෂ්ටිකත්වය

බොහෝ ප්‍රශ්ණ වලට විසඳුම් සෙවීමේ දී කෙටි කාලීන දෘෂ්ඨිකෝණයකින් බලා තීරණ කරා එළඹීම.

එම නිසා දිගු කාලීන සමාජ ප්‍රගමනයන්ට අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක නොවේ.

## අපූර්ණ තොරතුරු මත ප්‍රතිපත්ති කරා එළඹීම

අපූර්ණ තොරතුරු නිසා ආණ්ඩුවේ ප්‍රතිපත්ති අකාර්යක්ෂම වීම

## සානුබල කෙරෙහි අහිතකර ලෙස බලපෑම

ආදායම් හා ධන ව්‍යාප්තියේ සාධාරණත්වය ඇති කිරීම සඳහා ආණ්ඩුව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග සානුබල හා ඵලදායිතාව කෙරෙහි අහිතකර ප්‍රතිඵල ඇති කරයි.

ClassWork.LK

## ආණ්ඩුවේ මැදිහත්වීම්වලින් වැළකී සිටීමට කටයුතු කිරීම

ආණ්ඩුවේ විවිධ නීතිරීති හා නියාමනයන්ගෙන් වැළකී සිටීමට පුද්ගලයන් හා ආයතන කටයුතු කිරීම නිසා සැඟැවුණු ආර්ථිකයක් බිහි වීමට ඉඩකඩ පැවතීම

## පරිපාලන වියදම් ඉහළ යාම

ආර්ථිකය තුළ ආණ්ඩුවේ මැදිහත් වීම් අතිශයින් පිරිවැය අධික ක්‍රියාවක් විය හැකි ය.

අදාළ නීතිරීතිවලින් නියාමනයක් ක්‍රියාවට නැගීමේ දී ඒවායින් අපේක්ෂිත සමාජ ප්‍රතිලාභ එතරම් විශාල නොවීම නිසා අකාර්යක්ෂමතා පැන නැගිය හැකි ය.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura